# සාමාන්‍ය සමය විසිඑක්වන ඉරුදින | දේව ප්‍රකාශන

23-08-15

## පළමුවන දේව ප්‍රකාශනය

ජෝෂුවා 24:1-2,15-18

ජෝෂුවාගේ පොතෙන් උපුටා ගත් කොටසකි.

**(අපගේ දෙවියන් වන සමිඳුණන් වහන්සේට වැඳුම් පිදුම් කරන්නෙමු.)**

ඉන්පසු ජෝෂුවා සියලු ඉශ්රායෙල් ගෝත්‍රයන් ෂෙකෙම්ට රැස් කරවා, ඉශ්රායෙල්වරුන්ගේ ප්‍රජා මූලිකයන් ද ප්‍රධානීන් ද විනිශ්චයකාරයන් ද නිලධාරීන් කැඳවීය. ඔව්හු දෙවියන් වහන්සේ ඉදිරියෙහි පෙනී සිටියෝ ය. ජෝෂුවා මුළු සෙනගට මෙසේ කීවේය. "ඉශ්රායෙල්වරුන්ගේ දෙවි සමිඳුණන් වහන්සේ මෙසේ වදාරණ සේක. යටගිය දවස ආබ්‍රහම්ගේද, නාහෝර්ගේද පිය වූ තෝරා වැනි, නුඹලාගේ පියවරු යුප්‍රටීස් ගඟෙන් එතෙර වාසය කරමින් අන් දෙවිවරුන්ට වැඳුම් පිදුම් කළෝ ය. සමිඳුණන් වහන්සේට වැඳුම් පිදුම් කිරීමට ඔබ සතුටු නැත්නම් ඔබ වැඳුම් පිදුම් කරන්නට කැමති කවරෙකුට ද කියා අදම තීරණය කර ගන්න. ගඟින් එතෙර සිටි ඔබේ පියවරුන් වැඳුම් පිදුම් කළ දෙවිවරුන්ට හෝ ඔබ වාසය කරන දේශයේ සිටින අමෝරිවරුන්ගේ දෙවිවරුන්ට හෝ වැඳුම් පිදුම් කරන්නට තීරණය කර ගන්න. එහෙත් අපි එනම් මාගේ පවුල ද, මම ද සමිඳුණන් වහන්සේට වැඳුම් පිදුම් කරන්නෙමු. සෙනග පිළිතුරු දෙමින් "අන් දෙවිවරුන්ට වැඳුම් පිදුම් කරන පිණිස කවරදාවත් අපි සමිඳුණන් වහන්සේ අත් නොහරින්නමු. මන්ද, අප සහ අපේ පියවරුන් මිසර දේශය නැමති වහල්කමේ නිවාසයෙන් පිටතට ගෙනාවේත්, අපේ ඇස් ඉදිරියේ මහත් හාස්කම් කළේත්, අපේ මුළු මාර්ගයේ දී ද අප පසුකර ආ මුළු සෙනග අතරේ දී ද අප ආරක්ෂා කළේත් අපේ දෙවි සමිඳුණන් වහන්සේ ම ය. සමිඳුණන් වහන්සේ සියලු මනුෂ්‍ය වර්ගයන් ද දේශයේ සිටි අමෝරිවරුන් ද අප ඉදිරියෙන් එළවා දැමූ සේක. එබැවින් අපිත් සමිඳුණන් වහන්සේට වැඳුම් පිදුම් කරන්නෙමු. මන්ද, උන් වහන්සේ අපේ දෙවියන් වහන්සේ යැ"යි කීවෝය.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 34:1-2, 15-22

පිළිතුර: සමිඳුණන් ගුණවත් බව අත්දැකීමෙන් දැනගන්න.

ගීය: හැම වේලේ ම හිමි තුමන්ට මම ප්‍රශස්ති ගී ගයමි. එතුමන්ගේ ගුණ වැණුම් මා මුවින් තොර නොවෙයි. මම එතුමන්ගේ ගුණ වර්ණනා කරමි. නිහතමානී අය ඒ අසා තොස් වෙත්වා.

හිමි තුමන්ගේ දෙනෙත දමිටුන් දෙසට ද එතුමන්ගේ දෙසවන ඔවුන්ගේ කන්නලව්වට ද යොමා ඇත. පව්කම් කරන අය පොළොවෙන් අමතක වී යන ලෙස හිමි තුමාණෝ ඔවුන්ට විරෝධය දක්වන සේක. දැහැමි අය අයැදුම් කළහ; හිමි තුමාණෝ සවන් දී සියලු දුක් වේදනාවලින් ඔවුන් මිදූ සේක.

හිමි තුමාණෝ බිඳුණු සිත් ඇත්තන්ට ළං ව සිටින සේක; තැළුණු හදවත් ඇත්තන්ට පිහිට වන සේක. දමිටුන්ට බොහෝ ආපදා ඇතත්, හිමි තුමාණෝ ඒ සියල්ලෙන් ඔවුන් මුදා හරින සේක. එතුමාණෝ ඔවුන්ගේ ඇගේ එක ඇටයකුදු නෑර ඔවුන් රක්නා සේක; ඉන් එකක් වත් බිඳෙන්න නොහරින සේක.

දුෂ්ටයා නපුරෙන් වැනසෙයි. දැහැමි අයට දෙස් තබන්නෝ දඬුවම් ලබන්නෝ ය. හිමි තුමාණෝ සිය මෙහෙකරුවන් මුදන සේක. එතුමන්ගේ රැකවරණය සොයන කිසිවෙක් දඬුවම් නොලබන්නෝ ය.

## දෙවන දේව ප්‍රකාශනය

එපීසි 5:21-32

පාවුලු තුමන් විසින් එපීසිවරුන්ට ලියන ලද හසුනෙන් කොටසකි.

**(මෙය මහා අභිරහසකි. එය අදාළ වන්නේ ක්‍රිස්තුන් වහන්සේට සහ සභාවට ය.)**

ක්‍රිස්තුන් වහන්සේට ඇති ගෞරවය නිසා එකිනෙකාට යටත් වන්න. භාර්යාවෙනි, ඔබ සමිඳුණන් වහන්සේට මෙන්, තම ස්වාමි පුරුෂයන්ට යටත් ව සිටින්න. මන්ද, ක්‍රිස්තුන් වහන්සේ සභාවේ, එනම් උන් වහන්සේගේ ශරීරයේ, හිස වන්නාක් මෙන්,

පුරුෂයා භාර්යාවගේ හිස ය. උන් වහන්සේ එම ශරීරයේ ගැළවුම්කාරයාණෝ වන සේක. එබැවින් සභාව ක්‍රිස්තුන් වහන්සේට යටත් වන්නාක් මෙන්, භාර්යාවන් ද සියලු දේවල දී පුරුෂයන්ට යටත් විය යුතු ය. පුරුෂයෙනි, ක්‍රිස්තුන් වහන්සේ සභාවට ප්‍රේම කොට සභාව වෙනුවෙන් සිය දිවි පුද කළාක් මෙන්, ඔබත් ඔබගේ භාර්යාවන්ට ප්‍රේම කරන්න. උන් වහන්සේ එසේ කෙළේ, වචනය නමැති වතුරෙන් ද සභාව සෝදා පිරිසුදු කර, කැප කර, එය තේජාන්විත සභාවක් වශයෙන් කැළලක් වත්, රැල්ලක් වත්, එබඳු කිසිවක් වත් නැති ව විශුද්ධ ව, නිකෙලෙස් ව, තමන්ට ම ප්‍රදානය කරගැනීමට ය. එසේ ම පුරුෂයන් විසින් ද සිය භාර්යාවන්ට තම ශරීරයට මෙන් ප්‍රේම කටයුතු ය. සිය භාර්යාවට ප්‍රේම කරන තැනැත්තා තමාට ම ප්‍රේම කරගන්නේ ය. කවරකුවත් කිසි ම කලෙක තමාගේ ශරීරයට ද්වේෂ කරගෙන නැත. එසේ නොව, ඔහු එය පෝෂණය කරගෙන ආරක්ෂා කරයි. ක්‍රිස්තුන් වහන්සේ සභාව ගැන සලකන්නේත් එසේ ම ය. මන්ද, එය උන් වහන්සේගේ ශරීරය වන බැවිනි. අපි ඒ ශරීරයේ අවයවයෝ වෙමු. මේ නිසා මිනිසෙක් තමාගේ පියා ද මව ද අත්හැර සිය භාර්යාවට ඇලුම් වන්නේ ය. ඒ දෙදෙන එක් කෙනෙක් වන්නෝ ය. මෙය මහා අභිරහසකි. මට හැඟෙන පරිදි එය අදාළ වන්නේ ක්‍රිස්තුන් වහන්සේට සහ සභාවට ය..

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## සුපුවත් ජය නද

ජොහන් 6:63, 68

ආලේලූයා! ආලේලූයා!
"මා ඔබට වදාළ වචන ආත්මය ද ජීවනය ද වෙයි."
සදාතන ජීවනයේ වචන ඇත්තේ ඔබ වහන්සේ වෙත ය. ආලේලූයා!

## ශුද්ධවූ සුවිශේෂය

ජොහන් 6:60-69

ජොහන් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

("ස්වාමීනි, අප කවරෙකු වෙතට යන්න ද? සදාතන ජීවනයේ වචන ඇත්තේ ඔබ වහන්සේ වෙත ය.")

එය ඇසූ විට, උන් වහන්සේගේ ශ්‍රාවකයෝ බොහෝ දෙනෙක් "මෙය දරාගන්නට බැරි කීමකි, එතුමාණන්ට සවන් දී සිටිය හැක්කේ කාට දැ"යි තමන් අතරේ කතා කරගත්හ. ශ්‍රාවකයන් මෙසේ මැසිවිලි කියන බව ජේසුස් වහන්සේ දිවැසින් දැන ඔවුන් අමතා, "මෙය ඔබට අධෛර්යයට පත්වීමට හේතුවක් ද? එසේ නම්, මනුෂ්‍ය-පුත්‍රයාණන් පෙර සිටි තැනට නඟිනු බව ඔබ දුටුවොත් කෙසේ ද? ජීවනය දෙන්නේ ආත්මය වේ. මාංසයෙන් කිසි ප්‍රයෝජනයක් නැත. මා ඔබට වදාළ වචන ආත්මය ද ජීවනය ද වෙයි. එහෙත් නොඅදහන සමහරෙක් ඔබ අතරෙහි සිටිති"යි වදාළ සේක. එසේ වදාළේ, නොඅදහන්නෝ කවුරු ද කියාත්, තමන් වහන්සේ පාවා දෙන්නට යන්නේ කවරෙක් ද කියාත්, ජේසුස් වහන්සේ මුල සිට ම දැනගෙන සිටි බැවිනි. එහෙයින් උන් වහන්සේ ඔවුන් අමතා, "මාගේ පියාණන් වහන්සේගෙන් වරය ලැබූ කෙනෙකුට මිස, අන් කිසිවෙකුට මා වෙතට පැමිණිය නො හැකි බව මා කීවේ ඒ නිසා ය"යි වදාළ සේක. මේ නිසා එවක් පටන් උන් වහන්සේගේ ශ්‍රාවකයන්ගෙන් බොහෝ දෙනෙක් පසුබට වී, තවත් උන් වහන්සේ අනුව නොගියහ. ජේසුස් වහන්සේ දොළොස් දෙනා අමතා, "ඔබත් ඉවත් ව යන්නට සිතන්නහු දැ"යි ඇසූ සේක. සීමොන් පේදුරු පිළිතුරු දෙමින්, "ස්වාමීනි, අප කවරෙකු වෙතට යන්න ද? සදාතන ජීවනයේ වචන ඇත්තේ ඔබ වහන්සේ වෙත ය. ඔබ දෙවියන් වහන්සේගේ ශුද්ධවරයාණන් වහන්සේ බව අපි අදහමු. එසේ ම ඒ බව දනිමු"යි කී ය.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.

ලබන ඉරුදින දේව ප්‍රකාශන සඳහා http://sinhalagospel.lk/ වෙත පිවිසෙන්න.